

# 76 වන නිදහස් දිනය අදයි



ඕනෑම රටක, ජාතියක මෙවන් වූ අභිමානවත් දිනයක් සැමරීමේදී නිරායාසයෙන්ම සිහියට නැගෙන්නේ ඒ රටේ අනන්‍යතාව හුවා දක්වන වැදගත් සාධකය. ඒ අතර ජාතික ගීය, ජාතික ධජය පමණක් නොව එරටේ වැසියන්ගේ මාතෘ භාෂාව ද ඉතා වැදගත් වේ.



# ජාතික අභිමානයේ මුදුන් මල්කඩ බඳු සිංහ කොඩිය

**ලක් වැසියන් වන අපි ද අනාදිමත් කාලයක සිට ජාතියේ විශිෂ්ටත්වය කියාපාන්නට ධජ භාවිත කළ ජාතියක් වෙමු. ශ්‍රී ලාංකීය ජාතික කොඩිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ කොටසක් ලෙසද සැලකේ. ජාතියක ප්‍රබලත්වය, එක්සත්කම හා ස්වාධීනභාවය නිරූපණය කරන කැඩපතක් බඳු ජාතික කොඩිය කිසියම් ජාතියක ප්‍රබල සාධකයක් ලෙස මහජනයාගේ ගෞරව බුහුමානයට ලක් වන්නකි.**

සිංහල රාජ වංශය ඇරඹුනු තැන් සිටම සිංහ ලාංඡනය සිංහලයන්ගේ සංකේත ලාංඡනය වී තිබිණි. සිංහ ලාංඡනය සහිත කොඩිය ඈත අතීතයේ සිටම සිංහලයන්ගේ කොඩිය විය. එය වරින් වර ශ්‍රී ලංකාවේ නොයෙක් රාජධානි සහ ප්‍රදේශයන්හි ද විවිධ කෝරළවල ද රාජකීය කොඩියක් වශයෙන් භාවිතා කරන ලදී. අපේ රටේ අතීතයේ භාවිතා වූ ඇතැම් කාසිවලත්, රාජ්‍ය මුද්‍රාවලත් සිංහ රූපය තිබුණු බව ඉතිහාසයේ සඳහන් වී තිබේ. ක්‍රිස්තු පූර්ව 3 වැනි ශත වර්ෂයේ පෑතිස් රජතුමාගේ රාජකීය ධජය වූයේ සිංහ කොඩියයි. සමකාලීන භාරත මහා අධිරාජයාණන් වූ ධර්මාශෝක බෞද්ධ රාජයා විසින් ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධි අංකුරය වැඩම කරවීමේ කථා පුවත භාරතයේ සාංචි චෛත්‍යයේ නැගෙනහිර වාහල්කඩ තොරණෙහි කැටයම් කර තිබේ. මේ කැටයම් අතර සිංහල රාජ වංශයේ රාජ්‍ය සලකුණ වූ සිංහයාගේ රූපය කැපී පෙනෙයි. අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අසල තනවා ඇති මහා විහාරයේ සැලැස්ම සිංහ රූපයට සමාන වෙයි. සිංහලයාගේ කලා හපන්කම් සහ නිර්මාණ දස්කම් ලෝකයාට කියාපාන ජය භූමියක් වූ සීගිරියේ මහ ගල දොරටුව විශාල සිංහ රූපයකි.

දැනට ශ්‍රී ලංකාවේ පැරණිතම කොඩිය ලෙස හැඳින්වෙන්නේ දඹුලු විහාරයේ චිත්‍රයක දක්වා ඇති කොඩියකි. එහි දැක්වෙන්නේ දුටුගැමුණු රජතුමා ඉර, හඳ සමඟ දිවෙන කඩුවක් දකුණු අත දරා සිටින තේජාන්විත සිංහයා සහිත කොඩිය රැගෙන සටනට යෑමේ අවස්ථාවකි. එදා සිට අද දක්වාම අප ජාතික කොඩියේ අන්තර්ගත ප්‍රධාන සංකේතයක් ලෙස සිංහයා හැඳින්විය හැක. මෙම සිංහ ලාංඡනය සිංහල රාජ වංශය ආරම්භයේ පටන් භාවිතයට ගත්තකි. සිංහයා සහිත කොඩි, ලාංඡන මෙරටදී භාවිත කළ බවට හමුවන අප්‍රකාශිත සාක්ෂි බොහෝය. ශ්‍රී ලංකාවේ පළමු රජු ලෙස හැඳින්වෙන විජය රජතුමා ඉන්දියාවේ සිට මෙරටට පැමිණෙන විට සිංහ සංකේතය සහිත කොඩියක් රැගෙන ආ බවට මතයක් පවතී. අතීත රජ දරුවන් ස්වකීය රාජකීය මුද්‍රාව සහ කාසි හැඳින්වීමටද සිංහ රුව යොදා ගෙන තිබේ. මහා පැරකුම් රජුගේ මාළිගා මණ්ඩල ද්වාරයේද, නිශ්ශංකමල්ල රජු තම රාජකීය සිංහාසනයේද කාශ්‍යප රජු සීගිරි ද්වාරයටද සිංහ රුව යොදාගෙන ඇත්තේ සිංහල ජාතියේ අනන්‍යතාව ලොවට විදහා පෑම උදෙසා බව නොරහසකි. මිහින්තලයේ නිර්මාණය කර ඇති සිංහ රුව සිහිත සිංහ පොකුණ, අනුරාධපුර සහ පොළොන්නරු යුගයේ සිංහ රුව සහිත සඳකඩපහණ පිළිබිඹු කරන්නේ හෙළ කලාකරුවාගේ නිර්මාණාත්මක කෞශල්‍යය සඳහා සිංහ රුව පාදක කර ගත් අයුරුයි. සිංහල ජාතියේ අනන්‍යතාව මනාව විදහාපාන සිංහ ලකුණට දිගු ඉතිහාසයක් පවතින බව මේ සියල්ලෙන් තහවුරු කෙරේ.

වර්තමානයේ අප භාවිත කරන ජාතික කොඩියට පෙර මෙරට ජාතික කොඩිය වූයේ කන්ද උඩරට අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු භාවිත කළ සිංහ කොඩියයි. සිංහල රාජ්‍ය ඉංග්‍රීසීන්ට යටත් වීමත් සමඟ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සිංහාසනය, පාදස්ථලය, රාජ්‍ය මුද්‍රාව පමණක් නොව සිංහ කොඩියද ඉංග්‍රීසීන් යටතට ගැණුනි. එම සිංහ කොඩිය ඉංග්‍රීසීන් විසින් එංගලන්තයට රැගෙන ගොස් රාජ්‍ය ආරෝග්‍යශාලා භූමියේ තැන්පත් කළා යැයි සැලකේ. 1815 මාර්තු 02වන දා සිංහල රාජ්‍ය ඉංග්‍රීසීන් විසින් පවරා ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමත් සමඟ මහනුවර මඟුල් මඩුවේ දී ඔසවන ලද්දේ ඉංග්‍රීසීන්ගේ යුනියන් ජැක් නමින් හැඳින්වෙන කොඩියයි. ඒ හැරුණුවිට ශ්‍රී ලංකාවට වෙන් වූ යටත් විජිත කොඩියක් ද ඉංග්‍රීසීන් විසින් භාවිත කර ඇත.

> අතීත රජ දරුවන් ස්වකීය රාජකීය මුද්‍රාව සහ කාසි හැඳින්වීමටද සිංහ රුව යොදා ගෙන තිබේ. මහා පැරකුම් රජුගේ මාළිගා මණ්ඩල ද්වාරයේද, නිශ්ශංකමල්ල රජු තම රාජකීය සිංහාසනයේද, කාශ්‍යප රජු සීගිරි ද්වාරයටද සිංහ රුව යොදාගෙන ඇත්තේ සිංහල ජාතියේ අනන්‍යතාව ලොවට විදහා පෑම උදෙසා බව නොරහසකි.

ජාතික නිදහස උදෙසා යුහුසුලුව ක්‍රියා කළ පෙරටුගාමීහු සිංහලයේ පැරණි ජාතික කොඩිය සෙවීමේ උත්සාහයක නිරත විය. ඒ සඳහා මූලික වූයේ අධිනීතිඥ ඊ. ඩබ්ලිව්. පෙරේරා ප්‍රමුඛ කණ්ඩායමයි. එංගලන්තයේ තිබී ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ඒ අයුරින්ම පිටපත් කරවා වර්ණ ගන්වා මෙරටට ගෙන්වා ගනු ලැබුවේ ඩී. ආර්. විජයවර්ධන මහතායි. 1815 මාර්තු 02වන දා බිම හෙළූ සිංහලයේ පැරණි ජාතික කොඩිය ඉන් වසර 133කට පසු එනම් 1948 පෙබරවාරි 04 දා දිවයින පුරා යළි ලෙළ දෙන්නට විය. 1948 මෙරට ඉංග්‍රීසීන්ගෙන් ඩොමීනියන් නිදහසක් හිමි කර ගත් අතර ලාංකිකයන්ගේ මංගල නිදහස් උලෙළේදී එවකට අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතා විසින් ඔසවන ලද්දේ මෙකී අප සතු වූ පැරණි සිංහ කොඩියයි. මෙරට සඳහා නිල වශයෙන් ජාතික කොඩියක් තෝරා ගැනීම සඳහා ජාතික ධජ කමිටුව නමින් විශේෂ කමිටුවක් 1948 වසරේදීම පත් කරන ලදී. එහි සාමාජිකයන් වූයේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරණායක, සෙනරත් පරණවිතාන, ජේ. ආර්. ජයවර්ධන, ජී. ජී. පොන්නම්බලම්, ටී. බී. ජයා, කර්නල් ජේ. ඇල්. කොතලාවල, එස්. නඩේසන් සහ එල්. ඒ. රාජපක්ෂ යන මහත්වරුන්ය. 1950 දී ධජ කමිටු වාර්තාව රජය වෙත බාර දුන් අතර 1951 දී එම වාර්තාවේ සඳහන් ජාතික කොඩිය මෙරට නිල ජාතික කොඩිය වන බව පිළිග න්නා ලදී. නිර්දේශයන්ට අනුව මෙරට සුළු ජාතිකයන් නියෝජනය සඳහා කොළ සහ තැඹිලි පැහැති වර්ණ තීරු 02ක් එක් කරමින් නැවත ප්‍රති නිර්මාණය කළ ජාතික කොඩිය ප්‍රථම වරට පාර්ලිමේන්තුව අභියසදී ලෙළ දෙන්නට විය. 1972 ජනරජ ව්‍යවස්ථාවට අනුව ජාතික කොඩිය කහ පැහැති වර්ණයෙන් වට කර සතර කොන බෝපත්‍ර නිරූපණය කරනු ලැබීය.

හෙළ ජාතියේ මාතෘ භූමියේ ඓතිහාසික ප්‍රෞඪත්වය ස්වෛරීභාවය මෙන්ම ස්වාධීනත්වය පිළිබිඹු කරන ජාතික කොඩියේ ඇති සෑම සංකේතයකටම පාහේ විශේෂ අර්ථයක් ඇත.

සෘජුකෝණාස්‍රාකාර හැඩයකින් සමන්විත මෙරට ජාතික කොඩියේ දිග / පළලෙහි අනුපාතය 1:2 කි. එනම් උස ඒකක 1ක් වන විට දිග ඒකක 2ක් වන පරිද්දෙනි. 1985 අංක 693 දරන ශ්‍රී ලංකා ප්‍රමිතිකරණයේ සඳහන් පරිදි කොළ, තැඹිලි, ලෝහිත යන ජාතික කොඩියේ වර්ණ සහිත පෙදෙස් පිළිවෙළින් 1:1:5 යන අනුපාතයට සකස් විය යුතුය.

ජාතික කොඩිය මධ්‍යයේ දකුණතින් කඩුවක් අමෝරා ගත් සිංහයෙක් වේ. සිංහයා කහ පැහැති වන අතර සිංහයා වටා පසුබිම ලෝහිත පැහැයෙන් යුතුය. සිංහයා සහිත චතුරස්‍රාකාර පසුබිමේ කොන් සතරෙහි එක හා සමාන වූ කහ පැහැ ගත් බෝ පත්‍ර 4ක් වේ. සිංහයාට ඉදිරිපසින් තැඹිලි සහ කොළ පැහැයෙන් වර්ණ ගැන්වූ එකම ප්‍රමාණයේ සිරස් තීරු 02කි. කොඩිය වට කොට කහ පැහැති බෝඩරයක් වේ. ශ්‍රී ලාංකික ජාතික කොඩිය ඔස්සේ නිරූපිත වන අරුත සරලව ගෙන හැර දැක්වුවහොත් ලාංකික උරුමයන් ඔප් නංවමින් සුළු ජනයා හා එක්ව බහුතර ජනයාද ජීවත්වන ප්‍රතාපවත් දේශයක්ය යන්නයි. නමුත් ජාතික කොඩියේ එක් එක් පැහැයන් සහ සංකේත සඳහා නියමිත අරුත් වේ.

- **රන්වන් පැහැති සිංහයා ශ්‍රී ලංකා ජාතීන් හා එම ජාතීන්ගේ ශක්තියේ උදාරත්වය.**
- **බෝ කොළ සතර මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ.**
- **සිංහයා අතැති කඩුව ජාතියේ ස්වාධිපත්‍ය හා ජනතා එඩිතර බව.**
- **සිංහ හිසේ කෙහෙරැලි ආගමික පිළිවෙත්, ප්‍රඥාව සහ ධ්‍යානය**

**සිංහ වලිගයේ කෙහෙරැලි ආර්ය අෂ්ටාංගික මාර්ගය**

- **සිංහ නාසය බුද්ධිමත් බව**
- **සිංහයාගේ ඉදිරි පාද දෙක සම්පත් පරිහරණයේ නිවරැදි බව**
- **තැඹිලි වර්ණ සිරස් තීරුව ද්‍රවිඩ ජනතාව**
- **කොළ වර්ණ සිරස් තීරුව මුස්ලිම් ජනතාව**
- **වමේ කහ තීරුව බර්ගර් හා අනෙකුත් ජනතාව**
- **ලෝහිත පැහැති පසුබිම සිංහල බහුතරය**

සෑම විටම ජාතික කොඩිය කෙරෙහි ගෞරවයෙන් හා සංයමයෙන් යුතුව හැසිරීමට සැමදෙනා වගබලා ගත යුතුවන්නේ ශ්‍රී ලංකාවේ ම අභිමානය හා ගෞරවය විදහා දක්වනු ලබන සංකේතය ලෙස මෙම ජාතික කොඩිය හඳුන්වන බැවිනි.

**■ හෂිනි ඉරේෂා ගුණවර්ධන**